විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය தலைமுறையொன்றின் பெருமிதம் Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. : විවැ/උපදෙස් ලිපි අංක 03/2016
ඔබේ අංකය / உமது இல. / Your No. : ..........................
දිනය / திகதி / Date : 2016- 02- 8

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>කොන්ත්‍රාත්/ තාවකාලික/ පෞද්ගලික අවශ්‍යතා මත විදේශගත වන විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම</u>**

පෞද්ගලික අවශ්‍යතාවයන් මත රැකියා ගත වීම සඳහා තාවකාලිකව විදේශගත වන විශ්‍රාමිකයින් ඒ බව තම පදිංචියට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වාර්තා කළ යුතුය. ඔවුන් කොන්ත්‍රාත් පදනම මත වසර 3 කට වඩා අඩු කාලයක් සඳහා විදේශගත වන්නේනම් ඔවුන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කළ යුතුය. වලංගු ගමන් බලපත්‍රයෙහි සහතික කළ පිටපතක්, කොන්ත්‍රාත් පදනම මත රැකියාගත වීමේ ලිපියෙහි සහතික කළ පිටපතක් සහ අදාළ විශ්‍රාමිකයාගේ ඉල්ලීම් ලිපියක් හා Passport ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ලබා ගැනීම මඟින් විශ්‍රාම වැටුප් අවුරුදු 03ක කාලයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ගෙවීමට කටයුතු කල යුතුය. තවද ඔවුන්ගේ වාර්ෂික ජීවිත සහතික ලබා ගැනීම ඔබ විසින් සිදු කළ යුතු අතර ඒ සඳහා **Skype** තාක්ෂණය යොදා ගත යුතුය.

02. තවද වසරකට අඩු කාලයක් සඳහා විදේශ සංචාර, වන්දනා ගමන් සඳහා සහභාගී වන අය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම ඔබ විසින්ම සිදු කළ යුතු බව දන්වා සිටින අතර විදේශගත වන දින සිට නැවත පැමිණෙන දින තෙක් ජීවන වියදම් දීමනා රු. 2000ක් හා වෙනත් දීමනා රු. 3500ක් වන පරිදි ගෙවිය යුතුය. ණය සම්බන්ධයෙන් වන බැඳීම් වලදී අදාළ අය කිරීම් සිදු කිරීමට හැකි වන සේ ගෙවීම් කටයුතු සිදු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

03. මෙසේ විදේශ ගත වන විශ්‍රාමිකයින් සඳහා හඳුනාගැනීමට හැකිවන පරිදි ලේඛනයක් පවත්වා ගෙන යාම සිදු කළ යුතු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත සෑම වසරකම ජූනි 31 හා දෙසැම්බර් 31 දිනට වන සේ ලේඛනයක් ලැබීමට සැලැස්විය යුතුය.

04. එසේම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ විධිවිධානයන්ට අනුව විශ්‍රාම වැටුප වෙනත් කෙනෙකුට පැවරිය නොහැකි බැවින් ඇටෝර්නි බලපත්‍රලාභීන්ට සහ වෙනත් ගිණුම් හිමියන්ගේ නමින් විශ්‍රාම වැටුප ගිණුම් ගත කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. මේ අනුව ඉදිරි කටයුතු කිරීම තුළින් විශ්‍රාමිකයින් අපහසුතාවයන්ට ලක් නොවන අතර, ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

එස්.එෆ්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. විගණකාධිපති - අ.ක.ස.